

**'මා නිවත්ත අභික්කම' - නො නැවත ඉදිරියට යවු**

| 56 වන කාණ්ඩය | බු.ව. 2557 බිනර මස පුරපසළොස්වක දා ක්‍රි.ව. 2013 සැප්තැම්බර මස 19 වන දා | 05 වන කලබ |
|---|---|---|

# අපේ ළමා විරුවෝ

මගෙ පුංචි පුතේ මගෙ පුංචි දුවේ
මේ පුංචි රටේ සිරිමත්
මල් කැකුළු ඔබ යි මිණි මුතු ද ඔබ යි
ඔබ තමයි රටේ සම්පත්

ඔබෙ හදින් නැගී එන කුලුණු සිනා කැන්
සදයි දැයට සුව සෙත්
අගෙයි අගෙයි මුළු රට ම නැගෙයි
ඔබ නිසා සැවොම සැනසෙත්

ගුණෙන් නැණින් බැබැළෙමින් සොඳින්
දිරියෙන් ද ඉතා බලවත්
හෙළ පුංචි ළමා පෙළ දැන් ම ඉඳන්
ලක් මවුන් කරත් පොහොසත්

**- අනඳ**



# ආර්ය ධර්මය හා මෛත්‍රී බුදුන්ගේ ආගමනය

**අනගාරික ධර්මපාල තුමා විසිනි**

බුදුවරුන් සිව් නමක් ම පහළ වී ඇති හා ඉදිරියේ දී පස්වැනි බුදුන් වහන්සේ ගේ පහළවීම බලාපොරොත්තු වන වර්තමාන කල්පය මහා භද්‍ර කල්පය නමින් හැඳින්වේ. මෙම යුගය ක්‍රමයෙන් පිරිහේ. අවනීතිය රජවෙයි. සත්‍යයෙන් ඈත් වෙයි. දැඩි ලෝභය, මසුරුකම, දුෂ්ටකම ක්‍රමයෙන් වැඩි වර්ධනය වේ. පුරාණ ග්‍රන්ථයන් අනුව මේ යුගය තවත් අවුරුදු 250000 කින් අවසන් වන අතර නව මන්වන්තර යුගයේ පටන් ගැන්ම ආරම්භ වේ. බෞද්ධ අර්ථකථා අනුව, වත්මන් යුගය ක්‍රමයෙන් පිරිහීමට පත්ව අවසානයේ මහා ජලගැල්මකින් සියල්ලන් විනාශ වන අතර ඉතිරිවන සුළු කොටස අලුත් පරපුරකට මුල් වෙති.

සියල්ලන්ට ම මෛත්‍රී කරමින් අන් අයට හිංසා කිරීමෙන් වැළකී සොරකමින් වැළකී, පරදර සේවනයෙන් වැළකී, බොරු කීමෙන් වැළකී, මත් පැනින් වැළකී, මිථ්‍යා විශ්වාස අනුගමනයෙන් වැළකී, සුචරිත මාර්ගයේ ගමන්කරන අය මරණයෙන් පසු අනාගත බුදුන් වැඩ සිටින තුසිත දෙව්ලොව උපත ලබති. මතු බුදුවන බෝධිසත්ත්වයන් වහන්සේ බ්‍රාහ්මණ කුලයක උපත ලබන අතර අනාගතයේ දී කේතුමතී නමින් හැඳින් වෙන, වර්තමාන ඉන්දියාවේ බරණැස් නුවර උපත ලබති. එකල මිනිසුන් ගේ ආයුෂ ප්‍රමාණය ඉතා වැඩි වන අතර, සුචරිත ධර්මය පමණක්

රජවෙයි. එම රාජ්‍යයේ ප්‍රාණඝාත, සොරකම, පරදර පරපුරුෂ සේවනය, බොරු කීම, මත් පැන් පානය, නිර්වස්ත්‍ර හැසිරීම්, අයුතු බලපෑම්, කුඩා වූ මැටි හා අපිරිසිදු ගෙවල් දොරවල්, කැලි කසළ ආදියෙන් තොරවූ ඉතා අලංකාර උයන් වලින් යුතුවන අතර එය මහ පොළවේ දෙව්ලොවක් හා සමවෙයි.

මෙහි හොඳ දේ කරමින් දෙමව්පියන්ට හා වැඩිහිටියන්ට සලකමින්, මහණ බමුණන්ට සලකමින් සත්ව ඝාතනයෙන් වැළකී, මිථ්‍යා විශ්වාසවලින්, නග්න තවුස් දහමින්, ඇඟ අළු උලා ගන්නා තවුස් දමින් වැළකෙමින් , දුප්පතුන්ට දන්දෙමින් , කර්මය හා පුනරුත්පත්ති ධර්මය විශ්වාස කරමින්, කටයුතු කරන අය තුසිත දෙව්ලොව උපත ලබති. අලුත් පොළවක් හා අලුත් මිනිස් පරපුරක් ඇති වූ කල්හි මෛත්‍රී බෝසත්තුමා බරණැස් නුවර උපත ලබති. බෞද්ධ මාර්ගයේ යමින්, යහපත් ජීවිත ගතකරමින් කටයුතු කරන අය උපත ලබන්නේ තුසිත දෙව්ලොවයි. ගෞතම බුදුන්ගේ ශාසනයේ දී සතර මාර්ග ඵලයන්ට පත්වීමට අපොහොසත් වන හොඳ බෞද්ධයෝ මෛත්‍රී බුදුන්ගේ ශ්‍රාවකයන් බවට පත්වෙති. ඉදිරියට ඇති දෙදහස් පන්සිය වසරක් තුළ මෛත්‍රී බුදුන් පිළිබඳ පණිවුඩය ඇසිය හැකි ය. එම ධර්මය කහවත් පොරවා ගත් භික්ෂුන් වහන්සේලා විසින් පතුරුවා හරිනු ඇත.

ගෞතම බුදුන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලා අමතා දේශනා කරන ලද මජ්ඣිම  නිකායේ චක්කවත්ති සූත්‍රයේ ද මෛත්‍රී බුදුන්ගේ පහළ වීම ගැන සඳහන් වේ. සෑම බුදුවරයකු ම පහත සඳහන් ආර්ය ධර්මය දේශනා කරති. සුචරිතවාදයේ රජවූ ද මහා විශ්වයේ අධිපතියා වූ ද, චක්‍රවර්ති රාජයා විසින් තම රාජ්‍ය සුචරිත ධර්මයේ බලයෙන් පාලනය කරනු ලබයි. තම රටවැසියා විසින් දෛනිකව පිළිපැදිය යුතු චාරිත්‍ර ධර්ම දහයක් ඔහු විසින් ප්‍රකාශයට පත් කෙරේ. සියලු නපුරු ක්‍රියාවලින් හා ජීවිත විනාශ කිරීමෙන් වැළකීම, සොරකමින් වැළකීම, පරදර හා පරපුරුෂ සේවනයෙන් වැළකීම, අනුන් හෙළා දැකීමෙන් වැළකීම, මත් පැන් හා මත්ද්‍රව්‍ය ගැනීමෙන් වැළකීම, කෝප

නොවීම, දැඩි මසුරු කමින් හා මිථ්‍යා දෘෂ්ටියෙන් වැළකීම යනු ඒවා ය. චක්‍රවර්ති රාජයා සිය රාජ්‍යයේ සියලු වැසියන් බලයෙන් හිංසාවට පත් නොවීමටත් දුප්පතුන්ට ධනය ලබාදීමටත් තම අවංක ශ්‍රමයෙන් හා නොයෙකුත් කර්මාන්තවල යෙදෙමින් ධනය උපයන්නවුන්ට පහසුකම් ලබාදීමටත්, වග බලා ගත යුතු අතර වැසියන් තම පවුල්වල දෙමව්පියන් හා වැඩිහිටියන් රැකබලාගත යුතු බවටත්, ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට ගරු සැලකිලි කළ යුතු බවටත්, අනුශාසනා කරයි.

බුදුවරුන් දෙනමක් එකවිට පහළ නොවන අතර, සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක් පහළ වූ විට චක්‍රවර්ති රාජනීති රැසක් හා සුචරිත ධර්ම 10 ක් දේශනා කරති. පරිත්‍යාගශීලී වීම, සුචරිත මාර්ගයේ ගමන් කිරීමට කටයුතු කිරීම යහපත් සිතිවිලි උපදවා ගැනීමට පුරුදු පුහුණු වීම, දෙමව්පියන්ට හා ගුරුවරුන්ට ගරුකිරීමත්, ඔවුන්ගේ කටයුතු රැකබලා ගැනීමත්, අසනීප වූ විට රැකබලා ගැනීමත් ආගන්තුක සත්කාරයේ යෙදීමත්, යහපත් කටයුතුවලදී අන් අය ද සහභාගී කරවා ගැනීමත්, අනිකුත් අයගේ හොඳ කටයුතුවලට හවුල් වීමත්, යහපත කියා දීමත් යහපත් දෙයට ඇහුම්කන් දීමත්, අන් අයගේ නිදහසට ගරු කිරීමත් මෙම කරුණු ය.

සෑම මසකම පුරපසළොස්වක දිනයකදී ම පෙහෙවස් සමාදන් ව බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කිරීම, එනම් ඉඳුරන් පිනවීමෙන් වැළකීම, අවේලාවන්හි දී ආහාර නොගැනීම, දුශ්චරිත හා නැටුම් ගැයුම් පවත්නා ස්ථානවලට නොයෑම ආදී කරුණුවලින් වැළකී සිටීම ගෘහපතියන්ගෙන් අපේක්ෂා කෙරේ. එදින සුඛෝපභෝගී ආසනවල හිඳීම, අලංකාර වස්ත්‍ර හැඳීම, හා සුවඳ විලවුන් පාවිච්චි කිරීමාදියෙන් වැළකිය යුතු ය. සම්මා සම්බුද්ධත්වය, පච්චේකබෝධිය හා රහත් බෝධිය යන මේවා නිවන් ලබා ගන්නා මාර්ග තුනයි. පළමුවැන්න ශ්‍රේෂ්ඨ ය, දෙවැන්න මධ්‍යස්ථ ය, තුන්වැන්න එයට අඩු වූවකි. මහායානිකයන් බුදු වීම සඳහා

සුදනම් වන බෝධිසත්ව මාර්ගය පමණක් පිළිගන්නා අතර, මජ්ඣිම හෙවත් ඒකයානිකයන්ගේ මාර්ගය පච්චේක බෝධිය යි.

අනෙකුත් අයගේ ගැලවීම ගැන නොසොයා ඉතා ඉක්මනින් නිවන් දැකීම හීනයාන මාර්ගයයි. හීනයාන බෝධිසත්වවරුන් සර්වඥවරයකු අනුගමනය කරන අතර චතුරාර්ය සත්‍යය ස්වකීය උත්සාහයෙන්, දැන ගැනීමට නොහැකි වෙයි. පසේ බෝසතුන්ට සර්වඥවරයෙකු ගේ උපකාරය නැතිව, මාර්ගය සොයා ගත හැකි වන නමුත් අන් අයට දහම් දෙසිය නොහැකි ය. සර්වඥයන් වහන්සේලා පහළ නොවන කාලවල පසේබුදුවරු පහළ වෙති. හීනයාන ශ්‍රාවක බෝසතුන් පහළ වන්නේ සර්වඥයන් වහන්සේලා පහළ වන විටයි. උන්වහන්සේලා රහත් බවට පත් වී මේ ආත්ම භාවයේදී ම නිවන් දකිති. රහත් බව ලැබීම සඳහා එක් අසංඛ්‍ය කල්පයක් පාරමිතා ධර්ම සම්පූර්ණ කළ යුතු වේ. දස පාරමිතා නම් සම්පූර්ණයෙන් පරිත්‍යාගශීලී වීම සම්පූර්ණයෙන් සිල්වත් වීම ඉඳුරන් පිනවීමේ මාර්ගයෙන් සම්පූර්ණයෙන් ඈත්වීම, ශ්‍රේෂ්ඨ වූ අවබෝධය ලබා ගැනීමට ක්‍රියා කිරීම, අවසාන ඉලක්කය දක්වා ම, දැඩි උත්සාහයකින් ක්‍රියා කිරීම, සත්‍යවාදී වීම, සියල්ලන්ට ම සමාව දීම, අවසානය දක්වා වූ දැඩි අධිෂ්ඨානය, සියලු ම සත්වයන් කෙරෙහි මෛත්‍රී පැතිරවීම, සියලු කටයුතු හා අවස්ථාවන්හි දී මධ්‍යස්ථ භාවය රැකීම යන කරුණු ය.

පරිවර්තක : **බන්දුසිරි කංකානම්ගේ මහතා**

**"බෝසත් අනගාරික ධර්මපාලතුමා ලියූ ශාක්‍යමුනි ගෞතම බුදුන් වදාළ ආර්ය ධර්මය"** කෘතියෙනි



# අනගාරික ධර්මපාල අනුස්මරණ උදානය

**අනගාරික ධර්මසේකරතුමා විසිනි**

උතුම් දහමක්, ප්‍රබල අධ්‍යාත්මයක් හා පොහොසත් සංස්කෘතියක් වෙනුවෙන් කැපවුණු ලක්වැසි මහ සඟ පරපුර කිසිදු ආක්‍රමණික බලයකින් හෝ අධිපතිවාදයක් මගින් පරාජය කළ නොහැකි බව සරණංකර සඟරාජ හිමියන්ගෙන් ඇරැඹුණු ශාසන ප්‍රබෝධය මඟින් ලොවට ම පෙන්වා ඇත. ඉර නොබස්නා අධිරාජ්‍යයේ අධිපතිවාදී මිෂනාරි චින්තනයට අභියෝග කළ මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් දක්වා වූ මහ සඟ පරපුර සිංහලේ දර්ශනික දියුණුවේ අධ්‍යාත්ම බලයේ හා සංස්කෘතික පොහොසත් බවේ "සිංහ"සලකුණ වන බව නිසැක ය.

ලොව දියුණුම දර්ශනයෙන් පිබිදී එයින් ම ආධ්‍යාත්මික ශක්තිය ලබා පොහොසත් ම සංස්කෘතිය නිර්මාණය කළ සුන්දර දේශයේ හා උදාර ජාතියේ උරුමය ලෝකයා හමුවේ කියා පෑ අසහාය වීරයා වූ අනගාරික ධර්මපාල තුමන් කෙරෙන් ප්‍රකට වූයේ ඒ දර්ශනික උත්තුංගභාවය හා එක්වූ අධ්‍යාත්ම බලයයි. ළමා වියේදී ම පාණ්ඩුරාවාදය දැක බලා මිෂනාරි අධ්‍යාපනයේ හිස් බව අවබෝධ කරගෙන සමාජයේ ඉහළම පන්තියට අයත් ගිහි දිවියෙන් සමුගත් ධර්මපාලතුමා පළමුව ඕල්කොට්තුමා සමග රටපුරා යමින් ඕල්කොට්තුමන්ගේ දේශන සිංහලට පරිවර්තනය කරමින් ගිය ගමනේ දී පරම විඥනාර්ථවාදයේ අඩුලුහුඩුකම් දැක

අවබෝධ කරගෙන බෝධි චිත්තය මත පදනම් වූ මහා බෝධි සමාගම පිහිටුවා බෞද්ධ පුනර්ජීනවය ජාතිය අවදි කිරීම සඳහා යොදා ගන්නට තරම් ප්‍රඥාවන්ත විය.

බෞද්ධ උරුමයෙන් වෙන් වූ සිංහල ජාතියකුත් සැබෑ ජාතික විමුක්තිය උදා කිරීමෙන් තොරව බුදු සසුනේ චිරස්ථිතියකුත් නොවන බැව් අවබෝධ කරගෙන කටයුතු කළ ධර්මපාලතුමා "සිංහලයනි නැගිටිව්! බුද්ධගයාව බේරාගනිව්!" යන උද්යෝග පාඨයෙන් අපේක්ෂා කළේ ඉර නොබස්නා අධිරාජ්‍යයට යටවී තිබූ පුංචි ශ්‍රී ලංකාවේ දශලක්ෂ පහකටත් අඩුවූ සිංහල ජාතිය කෝටි සංඛ්‍යාවක ලෝක බෞද්ධ ප්‍රජාවේ නායකත්වය කරා ඔසවා තැබීමයි. සිංහලයන් අවදි කිරීමේ හඬ නගමින් බුද්ධගයාව බේරා ගැනීමේ ක්‍රියා මාර්ගය වටා ලෝක බෞද්ධ බලවේගය එකමුතු කිරීමේ පියවර තැබූ අනගාරික ධර්මපාලතුමා ඇමරිකා එක්සත් ජනපදයේ චිකාගෝ නුවර පැවැත්වුණු ලෝක දෘෂ්ටි සම්මේලනයේ දී ජාත්‍යන්තර මට්ටමේ වීරයකු බවට පත්වූයේ බුදු දහමේ පතාකය ඉහළින් ඔසවා තබමිනි.

චිකාගෝ දෘෂ්ටි සම්මේලනයේ මුලසුන දරූ මහාචාර්ය බැරෝස් මහතා ධර්මපාලතුමා කසාවතින් සැරසුණු ක්‍රිස්තුස් වහන්සේ ගේ විලාසය ගත්තේ යයි කියන්නට පෙළඹුණේ විසිනව වැනි වියේ පසුවූ තරුණ ධර්මපාල මැතිතුමා හින්දු දර්ශනය නියෝජනය කරමින් දෘෂ්ටි සම්මේලනය ඇමතූ ස්වාමී විවේකානන්ද තුමාටත් වඩා ඉහළින් ඉන්දියානු හා ආසියානු චින්තයේ අග්‍රඵලය වූ බුදු දහම ඉහළින් ඔසවා තැබූ හෙයිනි.

චිකාගෝ දෘෂ්ටි සම්මේලනයෙන් පසු හොනලුලු දිවයින කරා ගිය ධර්මපාලතුමා වටා මේරි පෝස්ටර් වැනි දනපතිනියන් පවා එක්වීමේ ප්‍රතිඵලය වූයේ අධිරාජ්‍යවාදී මූලස්ථානය වූ ලන්ඩන් නුවර බෞද්ධ විහාරයට පදනම දමමින් යුරෝපය පුරා බුද්ධ ධර්ම ප්‍රචාරක වැඩපිළිවෙළක් දියත් කිරීමට හැකිවීම යි. එංගලන්තයෙන් ප්‍රංශයටත්, ප්‍රංශයෙන් ජර්මනියටත්, ජර්මනියෙන්

රුසියාවටත් යමින් ධර්මපාලතුමන් බොදු හඬ නැගූ එක්දස් අටසිය අනූගණන්වලදී රුසියාවේ විප්ලවය සිදුවනු තබා බෝල්ෂෙවික් පක්ෂය පවා බිහිවී තිබුණේ නැත. රුසියාවෙන් කොරියාවට යමින් බොදු හඬ පැතිරවූ ධර්මපාලතුමන් පිළිග න්නට දස දහස් ගණන් කොරියානුවන් සිඹල් නුවරට එක්වූයේ එතුමන් ඒ වන විට ලෝක බෞද්ධ නායකයා ලෙස පිළිගැනෙමින් තිබුණු හෙයිනි. කොරියාවෙන් ජපානයට ආ ධර්මපාලතුමා පිළිග න්නට ටෝකියෝ නුවරට විසිදහසකට වැඩි ජනකායක් එක්වූයේ ඇමරිකාවේ චිකාගෝ නුවරදී නැගූ බොදු හඬ ජපන් ජනතාවට හොඳින් දැනී තිබූ බැවිනි. ජපානයෙන් චීනයේ ෂැංහයි නුවරට පැමිණි ධර්මපාලතුමන් පිළිගන්නට විසිපන්දහසකට වැඩි ජනතාවක් එක් වී සිටි බව වාර්තා වී ඇත.

තායිලන්තයෙන් බුරුමයටත්, බුරුමයෙන් යළි ඉන්දියාවටත් පැමිණි ධර්මපාලතුමන් ඉන්දියාවේ බුද්ධ භූමිවල බෞද්ධ අයිතිය තහවරු කරන්නට කටයුතු කළ අතර අනෙක් අතින් තමා සතු ජාත්‍යන්තර බෞද්ධ නායකත්වය උපයෝගී කර ගනිමින් ලංකාවේ අධිරාජ්‍ය විරෝධී ජාතික ව්‍යාපාරය ශක්තිමත් කරන්නට ද අධිෂ්ඨාන සහගත වූයේ ලොව දියුණුම දර්ශනයෙන් පිබිදී සිංහල ඉතිහාසයෙන් උරුම වූ ප්‍රබල ආධ්‍යාත්මික බලය හිමිකරගෙන ලෝකයේ පොහොසත්ම සංස්කෘතියේ ශක්තිය ප්‍රකට කරමිනි. ධර්මපාලතුමන් විසින් ලෝක මට්ටමින් ඔසවා තබන ලද සිංහල බෞද්ධ උරුමය සුරැකිව රැකගෙන දූවෙන ලොව නිවා සනසන විශ්වන්තරවාදී පිළිවෙත ලෝක බලවේග යක් බවට පත්කරන්නට ලොව දියුණුම දර්ශනයෙන් හා අධ්‍යාත්ම බලයෙන් ශක්තිමත් වූ පොහොසත්ම සංස්කෘතියෙන් පෝෂණය වූ ලක්ෂ ගණනක් තරුණ තරුණියන් බෝධි චිත්තයෙහි පිහිටා අපේ යුගයේ යථාර්ථයන් අනුව පුංචි සුන්දර ලංකාව ධර්ම උද්‍යාන දේශයක් බවට පත්කරන්නට කැපවිය යුතුව තිබේ.



# මකුලෑවේ විමල නාහිමි සඳ සැරදේ

(ශ්‍රී ලංකා රාමඤ්ඤ මහා නිකායේ "අධිකරණ නායක" පදවියෙන් පිදුම් ලත් පූජ්‍යතම මකුලෑවේ විමල නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේට බෞද්ධ ළමයා ගේ අභිවාදනය යි)



නිමල සිල් සිරින් නැගු යහ ගුණ රාවේ
කමල මුව චාම් සිනහව ඔප ලූවේ
පබල දම් විනය රකිනුව දෙන පීවේ
**විමල නා සමිඳු සැරදේ මකුලෑවේ**

සසරින් ගෙනා පින් මහිමය කැර දියුණ
තිදෙරින් සංවර ව තෙවළා දම් ඉගෙන
ගැඹුරින් ගුරුන් චිළි කළ මං පෙත සදන
**දෙවුරින් වැසී බැබැළේ හිමි සඳු සොබන**

පරියත්තියට සුදිලෙන පහනක් ම වෙති
පටිපත්තිය ම හැම තැන ඔසොවා තබති
ආපත්තියෙ දි කුදු වුව බිය පත් සිතැති
**සම්පත්තියකි ! ඔබ මෙ සසුන් බබුළුවති**

සිරි ලක් රාමඤ්ඤ මහ සඟ සබා මැද
පිරිපුන් අදිකරණ පද'සුන් අරා හිඳ
සිරි සෙත් සදන පුබුදු දන සතන් කොඳ
**සිරිමත් නා සමිඳු ඔබ ම ය සරා සඳ**

වටා පත යි ගොටු අත්ත යි අතින් දරා
වටා වම් උරෙහි පා හා සඟළ සරා
කටාරමක් ලෙස මෙ සසුන් ලෙනේ අරා
**ඉටා වැඩ ඉන්න සමිඳුනි විපත් වරා**

**- තිරිකුණාමලේ ආනන්ද අනුනාහිමි**



# ඵල ජාතකය

**විශාඛා විද්‍යාලයේ විශ්‍රාමලත් ආචාර්යාණි**
**ලක්ෂමී පෙරේරා මහාත්මනිය**

අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ වාසය කරන කල, පළතුරු උයන් හිමියෙකු වෙනුවෙන් මෙම ජාතකය දෙසූ සේක. මෙම උයන් හිමියා අඹ මිදි දොඩම් නාරං පේර වැනි පළතුරු ද, තවත් නොයෙක් පළතුරු වර්ග ද ඔහුගේ උයන්වල වවා තිබුණි. දැහැමි ජීවිතයක් ගත කළ මෙම තැනැත්තා වාසය කළේ සැවැත් නුවර ය.

උයන් හිමියා බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේලා නිවසට වැඩමවා මහානිසංස ලබා ගත හැකි දානමය පිංකමක් පැවැත්වී ය. එහෙත් අතුරුපස සඳහා ඔහුගේ පලතුරු උයනට සංඝයා වහන්සේලා වඩමවා පලතුරු පූජා කරන්නැයි, ඔහු උයන්පල්ලාට උපදෙස් දුන්නේ ය. හොඳින් ඉදුණු පලතුරු තෝරා බේරා ඔහු සඟරුවනට පූජා කළේ ය. පලතුරු පිළිබඳ මනා දැනුමක් ඇති උයන්පල්ලා හට ගසක ඉහළ සෑදී ඇති පලතුරුක් ගැන කිව හැක. මෙම ගෙඩිය අමු ය, තරමක් ඉදී ඇත, මෙය හොඳින් ඉදී ඇත, මෙය රසවත් ය, ඇඹුල් ය ආදී වශයෙන් කීමට දක්ෂ ය. මේ ලෙස පලතුරු තෝරා පූජා කළ අන්දම ගැන අනෙක් භික්ෂූහු බුදුරජාණන් වහන්සේට සැළ කළහ. පෙර කල ද මෙවැනි දක්ෂයන් සිටි බව වදාරා ඒ අතීත ජාතක කථාව බුදුහු මෙලෙස දේශනා කළහ.

පෙරකල බඹදත් රජු බරණැස් නුවර රජකරන කාලයෙහි සිටු කුලයක උපන් බෝසතාණන් වහන්සේ පන්සියයක් ගැල්කරුවනට

නායකව සිටියහ. ඔවුහූ වෙළෙඳාමේ යන මඟ එක් වනයක පිහිටි ආරණ්‍යයක් පසුකර යති. ''මේ ආරණ්‍යය වටා ඇති වනයෙහි බොහෝ විෂ ගස් ඇත. ඒවායේ ගෙඩි මාගේ අවසරය නොමැතිව නොකෑ යුතු ය'' යනුවෙන් ගැල්නායක තැන සියලු පිරිස රැස්කොට අණ කළේ ය. එම මඟෙහි ගමකට මායිම් වන්නට කිංඵල ගසක් විය. ඒ ගසෙහි මල්, කොළ, ගෙඩි අඹ හා සමානය . අඹ ගෙඩි වල සුවඳ ද, පැහැය ද රසය ද එක හා සමාන විය. නමුත් විෂ සහිත විය.

ගැල්කරුවන් මෙම සුවඳින් වශී වී, අවවාද අමතක කොට විෂ පලතුරු කෑහ. පළමුව ගිය ගැල්කරුවෝ විෂ ගෙඩි කා රෝගී වූහ. සමහර අය අවවාදය මතක් වී නොකෑහ. ගැල් නායක තැනගේ උපදෙස් පරිදි විෂ ගෙඩි කෑ අය වමනය කරවා, චතුමධුර පොවා සුවපත් කළහ. නැතහොත් මෙම විෂ ගෙඩි කෑ අය මරණයට පත් වෙති.

මෙලෙස මරණයට පත්වෙන, ගැල්කරුවන් ගේ වෙළෙඳ බඩු ගැනීමට ගම්වැසියෝ පුරුදුව සිටියහ. එහෙත් මෙදින ගැල්කරුවන් අසනීප ගතියෙන් පමණක් පසුවූ බැවින් එයට හේතුව බෝසත් ගැල්නායකතුමන් ගෙන් විමසූහ.

"මේ පලතුරු විෂ සහිත බව හේතු කීපයක් නිසා දැනගතිමි. ගම මායිමෙහි පිහිටි මෙම ගසෙහි ගෙඩි කැඩීමට කවුරුත් නොපැමිණෙන්නේ මන්ද? කුරුල්ලන් වඳුරන් වැනි සතුන් පවා ගසට එනු ඇත. එහෙත් මේ ගස අසල කිසිවෙක් නැත. ඒ නිසා මේ ගෙඩි කෑමට නුසුදුසු විෂ ගෙඩි බව දැනගතිමි"යි ගැල් නායක තැන පැවැසී ය.

උයන්පල්ලා වැනි නුවණැත්තන් පෙර කලත් විසූ බව බුදුරජාණන් වහන්සේ වදාළහ. එම ගැල්නායක තැන තමන් වහන්සේ බවත්, ඔහුගේ පිරිස බුදු පිරිස බවත් පැහැදිලි කළහ.

නුවණැත්තන්ගේ අවවාද පිළිපැදීම, ඒ අවවාද අමතක නොකොට පිළිපැදීමේ ප්‍රතිඵල , ඵල ජාතකයෙන් අපට ද ගතහැකි පාඩම වේ.



# බෝසත් අම්මා

**ඇමරිකාවේ වොෂිංටන් බෞද්ධ විහාරවාසී**
**පූජ්‍ය මණ්ඩාවල පඤ්ඤාවංස හිමිපාණන් විසිනි**

වයස 14 ක දරුවෙක් මැර කල්ලියකට බැඳීම සඳහා තම සුදුසුකම පෙන්වීමට තවත් අහිංසක නව යොවුන් තරුණයකු මරා දැමුවේ ය. එම මිනීමැරුම් නඩුව අසන විට වින්දිතයාගේ මව ශාන්ත නොඉවසිලි බවකින් උසාවියට වී නඩුවට කන්දීගෙන සිටියා ය. මිනීමරු දරුවා මරණයට වරදකරු විය. තීන්දුව ප්‍රකාශ කළ පසු එම මව සන්සුන්ව නැගී සිට දරුවා දෙස සෘජුව බලාගෙන මෙසේ කීවා ය.

“මම උඹව මරනව ”

වේදනාවෙන් පෙළෙන මවගේ මෙම ප්‍රකාශයත් සමගම කලබලයට පත් හිර නිලධාරීහු වහාම දරුවා ඉවතට ගෙන ගියහ.

පළමු මාස හය ගතවීමෙන් පසුව මරණයට පත් දරුවාගේ අම්මා විශේෂ අවසරයක් ලබාගෙන මෙම හිරකාර දරුවා බලන්නට ගියා ය. එම මිනීමැරුම කරන්නට පෙර දරුවා ජීවත් වී ඇත්තේ මහ පාරේ ය. ඔහුට කිසිදු නෑදෑයෙක් නොසිටියේ ය. එබැවින් ඔහු බලන්නට හිර ගෙදරට පැමිණි එකම තැනැත්තිය තමා අතින් මරණයට පත් වූ නව යොවුන් තරුණයාගේ ආදරණීය මව පමණි. දෙදෙනා ටික වේලාවක්

කතා කරමින් සිටියහ. අනතුරුව පිටත්වන්නට පෙර ඇය ඔහු අත මුදල් ටිකක් සහ සිගරට් කීපයක් තැබුවා ය. අනතුරුව ඇය නිතර නිතර මිනීමරු ළමා හිරකරුවා බලන්නට යන්නට පටන් ගත්තා ය. ආහාර සහ තෑගි බෝග ගෙනගොස් දුන්නා ය. බොහෝ වේලාවක් ළමා හිරකරුවා සමඟ කතාබහ කරමින් කල් ගත කළා ය.

ඔහුගේ වසර තුනක හිර කාලය අවසන් වන්නට ළං විය. ඒ අතර දිනක්, ඔහු පිටතට ආ කල කරන්නට බලාපොරොත්තු වන්නේ කුමක්දැයි එම මව දරුවාගෙන් විමසුවා ය. දරුවාට ඊට දෙන්නට පිළිතුරක් නොවී ය. ඔහුට යන්නට තැනක්වත් නොවී ය. ඔහු උත්තරයක් දීගත නොහැකිව අසරණව බිම බලාගෙන සිටියේ ය. ඇය ඔහුට තම යහළුවෙකුගේ කොම්පැණියක රැකියාවක් සොයා දෙන්නට පොරොන්දු වූවා ය. අනතුරුව ඕ ඔහුගෙන් නතරවන්නට බලාපොරොත්තු වන්නේ කොහේදැයි විමසුවා ය. තමන්ට යන්නට තැනක් නැති බව ඔහු ඉතා අසරණ හඬකින් කිවේ ය. එවිට ඒ මව තාවකාලිකව තම නිවසේ නතරවන්නට ඔහුට ඇරයුම් කළා ය.

මාස අටක් තිස්සේ ඔහු ඇගේ නිවසේ ජීවත් විය. ඈ කරුණාවෙන් පිසින ආහාර බුක්ති වින්දේ ය. මේ අතර දිනක් ඇය ඔහු සාලයට කැඳවා තමන් ඉදිරියෙන් අසුන්ගන්නැයි ඇණවූවා ය. මඳ වේලාවක් නිහඬව ඔහු දෙස බලාගෙන සිටියා ය. අනතුරුව නිහඬ බව බිඳිමින් කතාකරන්නට පටන් ගත්තා ය. "ඔය ළමයට මතක ද එදා උසාවියේ දී මං කියපු දෙය" මම උඹව මරනව"

"ඔව් මට හොඳට මතකයි. මට ඒ මොහොත කවදාකවත් අමතක වෙන්නේ නැහැ" දරුවා පිළිතුරු දුන්නේ ය.

"ඔව් මං ඒක කළා. ඇය තවදුරටත් කියාගෙන ගියා ය. මගේ පුතා නිරපරාදෙ මරාදාපු කොල්ලා ජීවත්ව ඉන්නව දකින්ඩ මට කොහොමවත් ඕනෑ වුණේ නෑ. මට ඒ මිනීමරු

කොල්ල මැරෙනවා දකින්නයි ඕනෑ කළේ. ඒ හින්දමයි මම ඔයාව බලන්ඩ හිරගෙදරට යන්ඩ පටන් ගත්තෙ. තෑගි, කෑම වර්ග ගෙනහිල්ල දුන්නෙත් ඒ නිසයි. රැකියාවක් හොයල දුන්නෙත් ඒ හින්දමයි. ගෙදර නවත්ත ගත්තෙත් ඒ හින්දයි. පුතේ ඔයාව වෙනස් කරන්නට මම පටන් ගත්තේ ඒ විදියටයි. දැන් ඒ පරණ මිනීමරු දරුවා නැහැ. මට මගේ පුතත් නැහැ. මේ ගෙදර දරුවා හිටිය කාමරයක් තියෙනවා. මම කැමතියි ඔය පුතා මගේ ම පුතා වෙනවට.

ඉතින් මම ඔයාගෙන් ඉල්ලා හිටිනවා මේ ගෙදර මාත් එක්ක නවතින්ඩ කියල. ඔයා දැන් මගෙ ආදරණීය පුතා, මම ඔයාගේ ආදරණීය අම්මා"

එම විසිවැනි සියවසේ පටාචාරාව නූතන කිසාගෝතමිය දරුවාගේ අහිංසක දෑස දෙස එක එල්ලේම බලාගෙන කියාගෙන ගියා ය.

ඒ ආකාරයෙන් ඕ තම කුසින් බිහි කර ගත් දිවෙන් රතු රුහිරු සුදුපාට කිරිකර පොවමින් තම පණටත් වඩා ආදරයෙන් හදවඩාගත් දරු පැටවා මරා දැමූ, කිසිදක උණුසුම හෝ මව්කිරි බිඳක් තොල ගා නොතිබු ඒ අහිංසක දරු පැටවාගේ මව බවට පත් වූවා ය.

**(කළු ඇමරිකානු මවක සහ කළු දරුවකු සම්බන්ධ මෙය සත්‍ය කතාවකි)**



(කෙටි කතාව)

# මලක සුවඳ

සිරි වජිරාරාමවාසී
**පූජ්‍ය පිටිපන සාසනරතන හිමිපාණන් විසිනි**

සිඟිති දුවේ පුතේ, ලෝකය නිර්මාණය වෙලා ඒ ලෝකයෙ බොහෝ සිදුවීම් සිදුවුණ බව ඔබට මතකයි නේද? ගියවර කලාපයේ දී ස්වභාව ධර්මයේ වටිනා සම්පත් මිනිසුන් අතර බෙදී ගිය හැටිත් ලෝකයේ ඇති නැති පරතරය ඇතිවුණ අයුරුත් අප කියා දුන්නා. එද බුදුහාමුදුරුවෝ දේශනාකරපු අග්ගඤ්ඤ සූත්‍රයේ තමයි මේ කරුණු කාරණා සඳහන් වෙන්නේ. ඒ කතාව බෞද්ධ ළමයා සඟරාව කියවන පුංචි ඔබටත් කථාව අහගෙන ඉන්න සමිතටත් කියල දෙන්නේ පොඩි හාමුදුරුවෝ. පුංචි ඔබත් හොඳට මේ කියලදෙන කාරණා මතක තියාගන්න ඕනේ.

පොඩි මහත්තයා මම අහපු ප්‍රශ්නයට පිළිතුරක් හොයා ගත්ත ද?

එහෙමයි අපෙ හාමුදුරුවනේ, එද ඒ මිනිස්සු සොබා දහමින් හැමෝට ම පොදුවේ පාවිච්චි කරන්නට ලැබුණ ස්වයංජාත හැල් වී තියෙන සරු බිම් අනුන් ගැන සොයන්නේ බලන්නේවත් නැතිව තමන් කැමති කැමැති විදිහට වෙන් කර ගත්තා. ඒ නිසා තමයි ඇති නැති පරතරය ඇති වුණේ. මේක තමයි හාමුදුරුවනේ මගේ පිළිතුර.

බොහොම හොඳයි. නිවැරදියි. පුතාගේ පිළිතුරේ ලස්සන කියමනක් තිබුණා. අනුන් ගැන සොයා බලන්නේ නැති ව කියන වචනය. මේ කියමනට හොඳම තනි වචනයක් තමයි 'ආත්මාර්ථකාමිත්වය' කියලා කියන්නේ.

මේ වගේ උදවිය ඕන තරම් රටේ ලෝකෙ එදත් හිටියා. අදත් ඉන්නවා. තමන්ට තිබුනහම ඇති . අනික් අයට මොනවා උනත් කමක් නෑ කියලා හිතන අය බොහෝම නරකයි. මේ අයගේ සිතුවිලි හැමවෙලාවෙ ම අයහපත්. කොහොම හරි තමන්ට වාසියක් වෙන දේ ගැන ම තමයි නිතරම කල්පනා කරන්නේ. මේ වගේ පහත් සිතිවිලි නිසා ජීවිතය දුකකට ම තමයි පත් වන්නේ. හැබැයි මේ විදිහට අනුන් ගැන හිතන්නේ නැතිව තමන් ගැන විතරක් හිතන අයට ගොඩක් කරදර දුක් ගැහැට විඳින්නට වෙනවා. ඒ දඬුවම ලැබෙන්නේ සොබාදහමින් ම යි.

හොඳම උදහරණය තමයි වසර කිහිපයකට කලින් මුහුදේ ඇති වුණ සුනාමි තත්ත්වය. සමහර උදවිය විනෝදෙට කොරල් පර කැඩුවා. කඩොලාන ගස් කපලා ඒ බිමේ ගොඩනැගිලි හැදුවා. තම තමන්ගේ වාසිය තකා. ඒත් මොකද උණේ, තත්පර ගණනකින් ඒ සියල්ල ම විනාශ වුණා. අනුන් ගැන හිතන්නේ නැති අයගේ ආයුෂ බොහො ම අඩුයි. ඒ නිසා පුතේ පුංචි කාලේ ඉඳලම තමන්ගේ වාසිය විතරක් හොයන්නේ නැතිව අනුන්ට යහපතක් වෙන වැඩ කටයුතුවල නිරත වෙන එකත් අපේ ජීවිතවලට එකතු කරගන්න ඕන. හුරු කර ගන්න ඕනෙ. මුලදී ටිකක් අමාරු උණාට මේ විදිහට ජීවත් වෙන්න හුරු පුරුදු ඒ කෙනාට දුක අඩුයි. සතුට වැඩියි. අපි හැමෝම කැමති සතුටින් ඉන්න නේද ?

'පර' කියන්නේ අනුන්ට. අර්ථකාමී කියන්නේ යහපතක් කරනවා කියන එකයි. එතකොට අනුන්ට හොඳක් යහපතක්

කරන අයට පරාර්ථකාමී කියල කියනවා. පරාර්ථකාමී වෙන්න ඕනෙ කරපු උදව්ව නැවත නැවත මතක් කරමින් කියවකියවා නෙමෙයි. එහෙම නැතිව මම මෙහෙම උදව් කළා මේ විදිහටත් කළා, ඒ නිසා මට මේ අය මේ විදිහට සළකන්න ඕනේ. මෙහෙම හිතුවොත් මේ නියම පරාර්ථකාමීත්වය නෙමේ. උදව් කළා එතැනින් ඉවරයි. නැවත උදව් බලාපොරොත්තු වෙන්න එපා. එහෙම උණොත් බැරිවෙලාවත් පෙරළා ඒ අය උදව් නොකළොත්, අපිට උදව් කරලා අවසානේ දුක් වෙන්නත් වෙනවා. උදව් ලබපු අය පෙරළා ප්‍රති උපකාර කිරීම ඒ අයගේ යුතුකමක්.

මේ ලෝකේ ශ්‍රේෂ්ටම පරාර්ථකාමී කෙනා කවු ද? පොඩි මහත්තයට කියන්න පුළුවන් ද?

වෙන කවුරුවත් නෙමේ පුතේ, ඒ අපි හැමෝගෙම ශාස්තෘන් වහන්සේ බුදුරජාණන් වහන්සේ ම තමයි.

පෞද්ගලිකව සරු ඉඩම් අල්ලගෙන ඒවායෙහි තිබුණ හැල් වී අනුභවයට පුරුදු වුණ මේ පිරිසෙන් එක් පිරිසකට හොඳට භව බෝග (හැල් වී) ලැබුණා. හැබැයි එසේ ඉඩම් නොලැබුණ අයගේ හිත් තුළ වෛර ඉරිසියා සිතුවිලිත් ඇති වුණා.

පිරිසකගෙ සිතේ සතුට ඇති වෙනකොට තවත් පිරිසක් දුකට පත් වුණා.

ඔන්න දැන් හැල් වී නැති දුකට පත්වුණ පිරිස ඇති අයගේ වී හොරකම් කරන්න පටන් ගත්තා. මේ ලෝකෙ සොරකම ඇතිවුණේ ඔය විදිහටයි.

බලන්න පොඩි මහත්තයා දවසින් දවස ලෝකයට මොනවාද සිදුවන්නේ මිනිසුන්ට මොකද සිදුවෙන්නේ....

ලබන කලාපයට....



# VISAKHA
# Chief Female Lay Disciple

**Compiled by: Srima Warusawithana**

Born into wealth and luxury – Visakha,
daughter of Dhananjaya and Sumana,
Attained the first stage of sanctity on hearing the Dhamma,
while just a child of seven;
Her kinsmen by marriage were devotees
of the naked ascetics– the nigantas,
But with skill and unsurpassed intelligence,
Visakha led them on to hear the sublime Dhamma.
Disciplined and virtuous, abiding by the ten-fold
conduct her father bequeathed her,
Along with plentiful material wealth and a
costly jeweled ornament – the mela palandana,
Which only a fortunate maiden – endowed
with beauty, strength and virtue
Could carry with ease upon her perfectly
fashioned, dainty body:
This costly ornament Visakha gifted
to the Buddha and the order of bhikkhus,
To build a mansion equipped with all the needs,
a haven of peace and quiet;

And with faith unwavering – saddha -
confidence in the Noble Triple Gem,
Gave generously - her time and wealth and ministering care.
So special were the qualities of head
and heart Visakha possessed,
That at times on the Buddha's request,
Visakha counseled the female nuns.
The day the bounteous offering of the mansion Migara
Mathu prasada (Poorvarama)
Great was the joy in Visakha's heart,
she acted like a gleeful child,
Singing the praises of the Buddha,
tracing her footsteps around the mansion,
Surrounded by her many children and grandchildren;
and they who watched this strange sight
Of stately, gracious Visakha acting like one deranged –
asked the Buddha why she acts so;
The Buddha gave reply: " Visakha is mindful and alert,
she is truly at peace,
This is simply her expression of happiness on a
noble wish fulfilled."
The Buddha conferred upon her the unique title
"Maha Upasika" – Chief female lay disciple;
Just as a skilful garland maker from a heap of
many hued, fragrant flowers
With utmost care makes beautiful garlands,
so should one gather together
Wholesome effects – kusal, through many
meritorious deeds, wisely and timely done.



# සිරිමත් දම්පල් විරු ගුණ සමරමු

**වේරදූවේ මහින්ද හිමි**
සිරි වජිරාරාමය



බොදු දරුවනි මෙය හොඳ හැටි අහගන්න
ගුණ දහමින් පොහොසත් සුරුවන් වෙන්න
දම්පල්තුමන් දුන් ඔවදන් කියවන්න
එතුමන් රැක්ක හෙළ දිවයින රැකගන්න

ගිය ගිය තැන්හි නොබියව සිහනද නංවා
සිය දෙස රකින්නට දිවියම කැපකරවා
කියා නිම කරනු බැරි ඔබ කළ සේවා
ඔවදන් රකිමු එම ගුණ සිහියට නංවා

නිදු සිටිය සිහළුන්ගේ දියුණුවට
කියා දෙමින් කළ යුතු දෑ ඉදිරියට
රටත් දුයත් සමයත් රකිනා ලෙසට
ලියූ ඔවා ගැලපෙයි අදටත් හොඳට